// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1956/16 - 2016 මාර්තු මස 01 වැනි අඟහරුවාදා - 2016.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01

2015 අගෝස්තු මස 21 වැනි දින හා අංක 1928/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇති බව එහි නියමය පරිදි දන්වමි.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 මාර්තු මස 01 වන දින.

7.2.1.1(අ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

අ. සාමාන්‍ය සේවක ගණය සඳහා බඳවා ගැනීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

7.2.1.1(ආ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

ආ. විශේෂ සේවක ගණය සඳහා බඳවා ගැනීම<br>
(තොරතුරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණ විෂයය)

තොරතුරු තාක්ෂණ විෂයය සඳහා සහ තාක්ෂණවේදය විෂයය යටතේ ජෛව පද්ධති තාක්ෂණ විෂයය සඳහා නියමිත විෂයයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

1A - G 23085 — 08 (2016/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7.2.1.1(ඇ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

ඇ. විශේෂ සේවක ගණය සඳහා බඳවා ගැනීම
(ඉංජිනේරු තාක්ෂණ විෂයය)

යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයන්ගෙන් එකකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ලබා ගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම.

7.3.2.1.(අ)(i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව

අධ්‍යාපන සුදුසුකම්

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් උපාධිය සහිත ගුරුවරයෙකු වීම.

7.3.2.1.(ආ)(i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(ආ) විශේෂ සේවක සංඛ්‍යාව

(i) අධ්‍යාපන සුදුසුකම්

නියමිත විෂයයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් උපාධිය සහිත ගුරුවරයෙකු වීම.

ආ උපලේඛනයේ අංක 15 තාක්ෂණය (ජෛව පද්ධති තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණවේදය ද ඇතුළත්ව) යන පේළිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| *විෂයය ක්ෂේත්‍රය* | *බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්* |
|---|---|
| 15 තාක්ෂණය<br>(i) ජෛව පද්ධති තාක්ෂණය | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ගෘහ විද්‍යාව, කෘෂි විද්‍යාව, හස්ත කර්මාන්තය, ජීවන නිපුණතා සඳහා වන ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යාව ඩිප්ලෝමාව ලබා තිබීම. |
| (ii) ඉංජිනේරු තාක්ෂණවේදය | ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් ලබාගත් තාක්ෂණවේදී උපාධියක් හෝ යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රයන්ගෙන් එකකට පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් ලබා ගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාව (NVQ Level 6) ලබා තිබීම. |

03 - 426

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.